**<u>තිරප්පනේ ප්‍රාදේශීය සභාව</u>**

**<u>2022.07.19 වන දින පෙ.ව 10.00ට පැවති මහ සභා රැස්වීම</u>**

***<u>පැමිණ සිටි ගරු මන්ත්‍රීවරුන්:</u>***

1. ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා
2. ඒ.ජී.මරියහාමි මැතිනිය - ගරු සභාපතිතුමා
3. ඒ. අන්වර් සදාක් මැතිතුමා - ගරු උපසභාපතිතුමිය
4. එස්.තිස්ස විජේසිංහ මැතිතුමා - ගරු සභික තුමා
5. පී.මධුර කුමාර පියරත්න මැතිතුමා - ගරු සභික තුමා
6. එච්.එම්.නාසිම් මැතිතුමා - ගරු සභික තුමා
7. ජී.නිමල් රාජපක්ෂ මැතිතුමා - ගරු සභික තුමා
8. බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා - ගරු සභික තුමා
9. ආර්.පී.නිසංසලා ලක්මාලි අබේරත්න මැතිනිය - ගරු සභික තුමිය
10. එන්.රශ්මි සංකල්පනා මිය -ගරු සභික තුමිය
11. කේ. නදීකා සෙව්වන්දි කරුණාරත්න මැතිනිය - ගරු සභික තුමිය
12. ජේ.රෝහණ විජේතිලක මැතිතුමා - ගරු සභික තුමා

***<u>නොපැමිණි ගරු මන්ත්‍රීවරුන් :</u>***

1. ආර්. ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා - ගරු සභික තුමා
2. ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා - ගරු සභික තුමා
3. ටිකිරි බංඩාර වනසිංහ මැතිතුමා - ගරු සභික තුමා

***<u>නොදන්වා නොපැමිණි ගරු මන්ත්‍රීවරුන් :</u>***

1. එච්.බී.නලින් හේරත් මැතිතුමා - ගරු සභිකතුමා

***<u>සහභාගී වූ නිළධාරීන් ;</u>***

1. ආර්.පී.පී. රේණුකා ලියනගේ මිය - ලේකම්
2. එම්.ආර්.ඩබ්.සී.කේ.රණවීර මිය - විෂය ලිපිකරු

**<u>(අ) පසුගිය රැස්වීම් වාර්තා සම්මත කිරීම.</u>**

**- <u>2022.06.16 දින පැවති ගරු මහා සභා වාරයේ වාර්තාව සභා සම්මත කිරීම.</u>**

අද දිනට නියමිත ගරු මහා සභාවේ න්‍යාය පත්‍රයේ මුලින්ම තිබෙන්නේ 2022.06.16 දින පැවති ගරු මහ සභා වාර්තාව සභා සම්මත කර ගැනීමයි.ඒ අනුව පසුගිය සභා වාර්තාවට සංශෝධන තිබේනම් ඒවා ඉදිරිපත් කරන ලෙසත්, පසුගිය සභා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් මම ගරු මහ සභාවට ඉදිරිපත් කරනවා.

**<u>යෝජනා අංක 103 - 06-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි,ගරු මහ සභාවෙන් අවසරයි. 2022.06.16 දින පැවති ගරු මහා සභා වාර්තාව සත්‍ය හා නිවැරදි බවට මම යෝජනා කරනවා.

**<u>ගරු සභික - කේ. නදීකා සෙව්වන්දි කරුණාරත්න මැතිනිය.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් 2022 ජූනි මස 16 වන දින පැවති ගරු මහාසභා වාර්තාව පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.*

**(ආ) ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන.**

විශේෂ නිවේදන යටතේ මට කියන්න තියෙන්නේ දැනට රටේ පවත්නා ඉන්ධන පශ්ණය නිසා මහ සභාවට විශාල දෙනෙකුට සහභාගී වෙන්න බැරි බව දැනුම් දුන්නා රට යතාතත්ත්වයට පත්වන නිසා සභාවත් යතා පරිදි කරගෙන යන්න පුලුවන් වෙයි.අපට තියෙන ලොකු ප්‍රශ්ණයක් තමයි බදු අය කර ගැනීමේ දුෂ්කරතාවය එබැවින් අපහසුතාවයන් කළමණාකරණය කර ගෙන සභාව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන මෙන් සියළු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා.

**(ඇ) ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ , පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන මහා සභාවට ඉදිරිපත් කිරීම.**

- ඒ අනුව ආදායම් පරීක්ෂක මහත්මා විසින් 2022 ජූනි මස ආදායම් වාර්තාව ඉදිරිපත් කර සිටිනවා.ඒ අනුව ජූනි මස ආදායම ලෙස රු.289,949.58 ක මුදලක් ආදායම් පරීක්ෂක මහතා විසින් එකතු කර තිබෙනවා.එයද මම දැන ගැනීම සඳහා ගරු මහ සභාවට ඉදිරිපත් කරනවා.

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**

**ලිපි අංක I.**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

කදුපාගම,මරදන්කඩවල ලිපිනයේ පදිංචි එස්.පි.සිරිසේන මා විසින් කදුපාගම තුලානේ හෙක්ටයාර 7.6 ක් පමණ වන රජයේ බිම් කොටස තුළ සත්ත්ව පාලන ගොවිපලක් පවත්වාගෙන යාම සඳහා වරණීය පදනම යටතේ දිර්ඝ තාලින බදූ බලපත්‍ර ලබා දෙන ලෙස ඉල්ලා ඇති ලිපිය ගරු මහා සභාවට සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරමි .
අදාළ පාර්ශවයකර බළපතුය ගෙනත් දුන්නා.සුසන්ත මන්ත්‍රීතුමා මෙම පුද්ගලයා සමඟ සාකච්ඡා කලා.පරිසර කමිටුවෙනුත් බැලුවා.එබැවින් සුදුසු තීරණයක් ගන්නා ලෙස ඉල්ලා සිටිනවා

**ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා.**

මමත් මේ ඉඩම බැලුවා ගවයන් ගොඩක් හිටියා.ප්‍රාදේශීය ලේකම් තුමිය මෙම ඉඩමේ ළිං දෙකක් කපා ගන්න අවසර දීලා තිබුනා.මේ සම්බන්ධයෙන් මහජන විරෝධතා නැති බැවින් මෙම ඉඩමට දීර්ඝකාලීන බදු පලපත ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - පී.මධුර කුමාර පියරත්න මැතිතුමා.**
ගරු සභාපති තුමනි, සති දෙකකට පෙර මෙම ඉඩමේ අයිතිකාරයා මට අනුරාධපුරයෙදී හමු වෙලා මේ පිළිබඳ විස්තර කිව්වා එබැවින් ඉහත යෝජනා මම ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජී.නිමල් රාජපක්ෂ මැතිතුමා.**

සභාපති තුමනි,මෙය ඉදිරිපත් කරලා තියෙන්නේ වාර්ෂික බළපත්‍රයක් නෙමේ.මේක නීතිඥ මහතෙකු හරහා ලියපු ලියවිල්ලක් තියෙන්නේ.මේ සඳහා අනුමැතිය දුන්නට මගේ අකමැත්තක් නෑ.නමුත් මේකේ නීත්‍යානුකූල භාවයක් නෑ.
මෙම ඉඩමේ අක්කර 18 ක් තියෙනවා.අක්කර 2 ක් එකතු කරලා අක්කර 20 කට බලපත්‍රය ලබා දෙන්න කියලා තමයි ඉල්ලන්නේ.විරුද්ධ නම් දැන්ම් දෙන්න හේතුවක් ඕන.

**ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.**

මේ සඳහා යෝජනා ස්ථිර වුනා.නමුත් නිමල් මන්ත්‍රීතුමා කියපු දේ හරි.ඕන කෙනෙකුට මේ පොරොන්දු ගිවිසුම ගහන්න පුලුවන්.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.**

මාත් මේ ගැන සොයා බැලුවා.අපට අක්කර 20 ක් කියනකොට මෙහි ගැටලුවක් තියෙනවවා පරිසර කමිටුවෙන් බලලා තියෙන නිසා මේ සම්බන්ධයෙන් හොද තීරණයක් ගන්න.

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

මේ සම්බන්ධයෙන් ගිය වර සභාවේදී සොයා බලා කරුණු ඉදිරිපත් කරන්න කිව්වා. මේක ඕන කෙනෙකුට ලියන්න පුලුවන් ලියවිල්ලක් මෙහි අක්කර 20 ක් තායෙන නිසා අවසරය දීම තුළින් අන්වර් සදාක් මන්ත්‍රීතුමා කිව්වා වගේ පසුවට අපට ගැටළුවක් එන්න පුලුවන්.මෙම ඉඩමේ අයිතිකාරයා කිව්වා ප්‍රාදේශීය ලේකම් අක්කර 16 ක් සඳහා බළපත්‍රයක් ලබා දුන්නා කියලා .නමුතු ඒක සභාවට ඉදිරිපත් කරලා නෑ.මේක මගේ අදහස් ප්‍රකාශ කිරීමක් පමණි.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ. අන්වර් සදාක් මැතිතුමා.**

සුදුසුකමක් තියෙනවනම් දෙමු.

ගරු ප්‍රාදේශීය සභා සභික - ජී.නිමල් රාජපක්ෂ මැතිතුමා.

අපට මහජන විරෝධතා තියෙනවද කියලා තමයි බලන්න තියෙන්නේ මෙතන ගමේ එක්කෙනෙක් ඉන්නවා එයාටත් අදහස් ප්‍රකාශ කරන්න කියන්න.

නිස

ගරු ප්‍රාදේශීය සභා සභිකතුමිය - ආර්.පී.නිසංසලා ලක්මාලි අබේරත්න මැතිනිය.

මමම මේ ඉඩමේ අයිතිකාරයා පොඩි කාලේ ඉඳන් දන්නවා.මා දනා තරමින් මේ සම්බන්ධයෙන් ගමේ විරෝධතා නෑ.

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**ලිපි අංක - I .**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

තාක්ෂණිකනිලධාරිවයි.අයි.අබේසේකරමහතාවිසින්ක්ෂේත්‍ර රාජකාරි සඳහාඉන්ධන ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවට සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කරමි.

ගියවර සභාවේදී ඉන්ධන ලීටර් 10 ක් ලබා දීමට සහ ගමන් වියදම් නෙදීමට තීරණය වුනා නමුත් නැවත අපි මේ ගැන සාකච්ඡා කළා. ගමන් වියදම් කප්පාදු කරන්න බෑ.

**යෝජනා අංක 108 - 06-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

පළමුව මම නිමල් මන්ත්‍රීකුමාට සුභ උපදිනයක් වේවායි ප්‍රාර්ථනා කරනවා.ඒ වගේම ගරු උපසභාපති තුමියටත් සුභාෂිත්ෂණ පිරිනමනවා.තාක්ෂණික නිළධාරීත් එක්කත් මේ ගැන සාකච්ඡා කළා.අපි තීන්දුවක් ගන්නේ සභාව පැත්තෙන් හිතලා.මෙම නිළධාරී මහතාට ඉතා විශාල දුර ප්‍රමාණයක් එන්න තියෙනවා.එබැවින් ගමන් වියදම් සඳහා පෙට්‍රල් ලීටර් 25 ක් ලබා දීමට සුදුසු බවට මම යෝජනා කරනවා.එමෙන්ම ක්ෂේත්‍ර රාජකාරී කටයුතු වල යෙදෙන සියළු නිළධාරීන් සඳහා මෙම ඉන්ධන දීමනාව සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.ෙ

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ ගිය මාසේ සභාවෙන් ප්‍රෙට්‍රල් මිළදී ගත්තේ නෑ.

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - II .**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

පළාත් පාලන ආයතනවල වරිපනම් බදු කාර්යය සඳහා දේපල තක්සේරු කිරීම වෙනුවෙන් ඉදිරිපත්කර ඇති ලිපිය ගරු මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත්කර ඇති ලිපිය ගරු මහ සභාවට සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කරමි. දැන් තක්සේරු දෙපාර්තමේන්තුවේ නිළධාරී හිඟයක් තියෙන නිසා තක්සේරු නිළධාරීන් නෑ කියලා දැනුම් දීලා තියෙනවා.පළාත් පාලන අමාත්‍යාංශයෙන් සියළුම පළාත් පාලන ආයතන වලට දැනුම් දීලා තියෙනවා සුදුසු තක්සේරුකරුවන් අරගෙන ගෙවලා කාර්යය කරගන්න කියලා.

__යෝජනා අංක 109 - 06-2022.__

__ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.__

මේක බදවා ගැනීමක් නොවේ.සභාවක් විදියට දිගින් දිගටම මෙම කාර්යය සිදු කර ගැනීමට අවශ්‍ය නිසා සති දෙකක් තුළ සේවාව ලබා ගෙන නාම කළ යුතු බවත් මේ සඳහා මිළි ගණන් කැඳවා සුදුසු මිළි ගණන් යටතේ සේවාව ලබා ගැනීම සුදුසු බවට මම යෝජනා කරමි.

__ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා.__

එම යෝජනාව මම ස්ථිර කරනවා.

__ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.__

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඡන්දයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

__ලිපි අංක - III.__

__ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.__

පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් සඳහා වන දායකත්වය ඉහල නැංවීම වෙනුවෙන් පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය එවා ඇති ලිපිය ගරු මහා සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා. මෙම ලිපිය සම්බන්ධයෙන් සභාව දැනුවත් කරන්න කිව්වා මෙම සභාවට ණය මුදලක් අරගෙන කරගෙන අසීරුයි.ඉදිරියේදී එන වාතාවරණය බලලා අපි මොකක් හරි දෙයක් කරමු.

__යෝජනා අංක 110 - 06-2022.__

__ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.__

. තිරප්පනේ බළ ප්‍රදේශයට සූර්යය තාපය සුළං මේ දෙකම තියෙනවා.ඒ වගේම රටේ විදුලි බළාගාර ඕන තරම් ජලය තියෙනවා.නමුත් රටේ පෞද්ගලික බළාගාර විශාල ප්‍රමාණයක් තියෙනවා.මේ ඔක්කොම ඇමතිවරුන්ට අයිති.මූලික දේ තමයි පුනර්ජනනීය බළශක්තිය ලබා ගත යුතුය.රාජ්‍ය වියදමින් නිවාස සඳහා සෝලා පද්ධති ලබා දීලා ජාතික විදුලු පද්ධතියට එකතු කිරීම සුදුසුයි.

__ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.__

අපේ රටට පුනර්ජනනීය බළශක්තිය අවශ්‍යයි.මීට පෙර මෙවැනි ව්‍යාපෘති ආවත් මුදල් නොමැතිකම නිසා සාර්ථක වුනේ නෑ.මේක ජාතික විදුළ බල පද්ධතියට එකතු වෙනවා.සභාවේ මුදල් නොමැතිකම නිසා ණය වෙලා කරන්න බෑ.එබැවින් මෙය පසුවට සිදු කරමු.

__ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ. අන්වර් සදාක් මැතිතුමා.__

ලංකාව පුරා මෙම ව්‍යාපෘතය ක්‍රියාත්මකයි.සෝලා පැනල් ස්ථාපිත කිරීම සඳහා උතුරු මැද පළාතේ පාසල් කහිපයක් තෝරා ගෙන තියෙනවා.සියළුම වියදම් රජයෙන් දරන්නේ තිරප්පනේ පාසල තෝරා ගෙන තියෙනවද කියලා සෙයලා බලන්න.එතන කරනවානම් අපට මේ පළාතටම විදුලිය ලබා දනේන පුලුවන්.එබැවින් තිස්ස මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

පාසල් වල ලොකු වහල තියෙන නිසා පළාත් සභාවෙන් යෝජනා කළා සෝලා පැනල් ස්ථාපිත කරන්න.ඒක ජාතික පද්ධතියට එකතු කරනවා.

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - IV.**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

ජාතික අයවැයවක්‍ර ලේඛ අංක 03/2022 - රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් එවා ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා. අදහස් තියෙනවනම් අපේ මට්ටමින් කරන්න පුලුවන් දේවල් ඉදිරිපත් කරන්න.අදහස් තියෙනවනම් සොයලා බලලා ඊලග සභාවට ඉදිරිපත් කරන්න.

**යෝජනා අංක 111 - 06-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.**

ප්‍රාදේශීය සභාවේ වගා කරලා රටේ තත්ත්වය විසදන්න බැ.ලංකාවේ බිලියන 13 ක් ණයයි.

**ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

මේක බරපතල කාරණයක් ලංකාව විශාල ලෙස ණය වෙලා තියෙනවා.නමුත් ඒ ණය හරියට ආයෝජනය කරලා නෑ.ලංකාව හිඟන රටක් බවට පත් කරලා ඉවරයි.අපටත් ඩොරල් හොයන්න පුලුවන්.නමුත් අපි පිට රටින් එනකම් බලන් ඉන්නවා.ඒ වගේම සභාවේ වියදම් පාලනය කරන්න ඕන.ලබන සභාවට මේ සඳහා යෝජනා ඉදිරිපත් කරන්න ඕන.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**(ඊ) කාරක සභාවල වාර්තා ඉදිරිපත් කිරීම.**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

කාරක සභා වාර්තා ඉදිරිපත් කිරිම යටතේ පහත සඳහන් කමිටු

<u>**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ ඉදිරිපත් කිරිම.**</u>

<u>**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**</u>

2022 ජූනි මස ආදායම් වියදම් අයකර ගැනිම පිළිබඳ මාසික ප්‍රගති වාර්තාව (එල්.ජී.06) හා මාසික වියදම් වාර්තාව

( එල්.ජී.13) ගරු මහා සභාවේ දැන ගැනිම සඳහා මෙන්ම අනුමැතිය සඳහා ද ඉදිරිපත් කරනවා.

<u>**යෝජනා අංක 119- 06-2022.**</u>

<u>**ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.**</u>

ගරු සභාපතිතුමනි, සියළුම දෙනාගෙන් අවසරයි. සභාවට ඉදිරිපත් කරන ලද 2022 මැයි මස ආදායම් වියදම් අයකර ගැනිම පිළිබඳ මාසික ප්‍රගති වාර්තාව (එල්.ජී.06) හා මාසික වියදම් වාර්තාව ( එල්.ජී.13) සත්‍ය වාර්තා බවට මම යෝජනා කරනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභා සභික -** බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා **මැතිතුමා.**</u>

එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**</u>

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

<u>**(ඌ) නොපැමිණෙන මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අවසර ලිපි ඉදිරිපත් කිරිම.**</u>

යන සභික වරුන් විසින් නොපැමිණෙන බවට දැනුම් දීලා තියෙනවා.

<u>**(එ) ගරු සභිකවරුන්ගේ වෙනත් අදහස් ඉදිරිපත් කිරිම.**</u>

<u>**ගරු ප්‍රාදේශීය සභා සභික -** පී.මධුර කුමාර පියරත්න **මැතිතුමා.**</u>

ගියසැරේ පරිසර කමිටුව කැදෙව්වාට ගොඩක් අය සහභාගී වුනේ නෑ.ඒ නිසා ඒ සඳහා වාහනයක් ලබා දෙනවා නම් බෙහෙවින් උපකාරයක් වේවී.ඒක මගේ පළමු අදහස මගේ දෙවෙනි අදහස තමයි තෙල් පෝලීම් වල ඉන්න අයට ඉතා වැඩි මිළට තෙල් ලබා දීම සිදුවෙනවා.මේක කොහොමද වෙන්නේ කියලා සොයලා බලන්න.

<u>**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.**</u>

ඉන්ධන පෝලිම් රටේ ලොකු ප්‍රශ්ණයක් වෙලා තියෙනවා.බිරිද ගෙදර දවස් ගානක් නෑ ඒ නිසා සමාජ ගැටළු ගොඩක් තියෙනවා මේ සැම ප්‍රශ්නෙටම උත්තරේ හෙජින් ගිවිසුම .දැන් ලෙඩ්ඩුන්ට බොහෙත් නෑ හෙට දවසේ උද්දමණය වැඩියි.ඒකට දේශපාලන වටපිටාව සකසගන්න කියලා මම යෝජනා කියලා

<u>**ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ. අන්වර් සදාක් මැතිතුමා.**</u>

පළමුව උප සභාපති තුමියට මගේ සුභාශින්ෂණ පිරිනමනවා.ජන්දේ පැවැත්වූ දින අසනීප නිසා සහභාගී වන්න බැරි වුනා.ලැබිච්ච තනතුර ඉතා ගෞරවයෙන් කරගෙන යන්න කියලා මම ඉල්ලා සිටිනවා.ජන්දය දුන් සියළු දෙනාට මම ස්තුතිය ප්‍රකාශ කදර සිටිනවා.

රෝහණ මන්ත්‍රී තුමා කිව්වා ඉන්ධන ප්‍රශ්නය සම්බන්ධයෙන් මම සභාවට ආවෙත් අපහසුතාවයෙන් මම කනිජ තෙල් නීති ගත සංස්ථාවේ සභාපති තුමාටත් කතා කලා.එතුමා මට කිව්වා සභාවේ මන්ත්‍රීවරුන්ගේ නම් ලැයිස්තුව ඇතුළත් කරලා ලිවුමක් භාර දෙන්න කියලා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

සියළු මිනත්‍රි වරුන් වාහන අංක ලබා දෙන්න.අපි ලියුමකි යවමු.නමුත් ගල්කුලම ශෙඩ් එකෙන් හදිසියට ඩීසල් දුන්නේ නෑ.දිසාපති තුමාට කතා කරලා සීටීබී එකෙන් තමයි ගහගත්තේ මේ ලියුම යැව්වත් අනුරාධපුරයෙන් තමයි තෙල් ගහගන්න වෙන්නේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික -එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

ඉන්ධන ප්‍රශ්නයට අපිට මැදිහත් වෙන්න බෑ කිසිකෙනෙකුට කිසිම සැලැස්මක් නෑ කුට වෙළඳුන් හැමතැනම ඉන්නවා.මට ඔය ලියුම් එපා මේ තියෙන තත්ත්වයත් එක්ක මිනිස්සු යක්කු වෙලා ඉන්නේ මිනිසුසු හමුදාවට සහ වෛද්‍ය වරුන්ට පවා ගහනවා ඉන්ධන සියළු දෙනාටම අත්‍යවශයයි.225 තුළත් අවංක මිනිස්සු ඉන්නවා.අපේ රටට යහපත් නායකත්වක් අවශ්‍යයයි.තිරප්පනේ සියළු ජනතාවට තෙල් ලබා දෙන ක්‍රමවේදයක් සකසන්න කියලා මම ඉල්ලා සිටිනවා .

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

ඒ අනුව අද දින සභාවේ වැඩ කටයුතු වලට සහභාගී වී සහයෝගය ලබා දුන් සියළුම දෙනාටම ස්තුතිවන්ත වන අතර,අද දින සභාවේ වැඩ කටයුතු හමාර කරනවා.ස්තුතියි.

2022.07.19 වන දින පැවති ගරු මහ සභාවේ වැඩ කටයුතු පෙ.ව.11.15 ට පමණ අවසන් විය.